නවයුගය අතිරේකය

# ජනගහන තොරතුරු 2001



ජන හා නිවාස සංගණනය,
2001
මූලික ප්‍රතිඵල සාරාංශය
(යාවකාලික)

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙනි**

# ජන හා නිවාස සංගණනය, 2001
# මූලික ප්‍රතිඵල සාරාංශය (යාවකාලික)

**1. ආවරණය වූ ප්‍රදේශ**

සංගණන ගණන් ගැනීම සම්පූර්ණයෙන් සිදු කිරීමට හැකි වූයේ දිස්ත්‍රික්ක 18 ක ය. බස්නාහිර, . මධ්‍යම, දකුණ, වයඹ, උතුරු මැද, ඌව සහ සබරගමුව පළාත්වල සියලු දිස්ත්‍රික්ක 17 සහ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කය ඊට ඇතුළත් වේ.

යාපනය, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල ගණන් ගැනීම සිදු නොකෙරුණි. මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් (ප්‍රා. ලේ) කොට්ඨාශ 5 න් 1 ක පමණක් අර්ධ වශයෙන් ගණන් ගැනීම සිදු කරන ලදී.

වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රා. ලේ. කොට්ඨාශ 4 න් 1 ක ගණන් ගැනීම සම්පූර්ණයෙන් සිදු කරන ලද අතර 2 ක අර්ධ වශයෙන් සිදු කරන ලදී. මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රා. ලේ. කොට්ඨාශ 12 න් 5 ක සම්පූර්ණයෙන් ගණන් ගැනීම සිදු කළ අතර 6 ක අර්ධ වශයෙන් සිදු කරන ලදී.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ කොට්ඨාශ 11 න් 7 ක සම්පූර්ණයෙන් ගණන් ගැනීම සිදු කළ අතර 2 ක අර්ධ වශයෙන් ගණන් ගැනීම සිදු කරන ලදී.

වගුව **A** - දිස්ත්‍රික්ක අනුව සංගණනයේ ගණන් ගන්නා ලද ජනගහනය, අන්තර් සංගණන වර්ධනය සහ වාර්ෂික වර්ධන අනුපාතික, **1981-2001**

| දිස්ත්‍රික්කය | ගණන් ගන්නා ලද ජනගහනය | | අන්තර් සංගණන වර්ධනය | | සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය **1981-2001** (ප්‍රතිශතය) |
|---|---|---|---|---|---|
| | 1981 සංගණනය | 2001 සංගණනය | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| කොළඹ | 1,699,241 | 2,234,146 | 534,905 | 31.5 | 1.3 |
| ගම්පහ | 1,390,862 | 2,066,096 | 675,234 | 48.5 | 1.9 |
| කළුතර | 829,704 | 1,060,800 | 231,096 | 27.9 | 1.2 |
| මහනුවර | 1,048,317 | 1,272,463 | 224,146 | 21.4 | 1.0 |
| මාතලේ | 357,354 | 442,427 | 85,073 | 23.8 | 1.1 |
| නුවරඑළිය | 603,577 | 700,083 | 96,506 | 16.0 | 0.7 |
| ගාල්ල | 814,531 | 990,539 | 176,008 | 21.6 | 1.0 |
| මාතර | 643,786 | 761,236 | 117,450 | 18.2 | 0.8 |
| හම්බන්තොට | 424,344 | 525,370 | 101,026 | 23.8 | 1.1 |
| අම්පාර | 388,970 | 589,344 | 200,374 | 51.5 | 2.0 |
| කුරුණෑගල | 1,211,801 | 1,452,369 | 240,568 | 19.9 | 0.9 |
| පුත්තලම | 492,533 | 705,342 | 212,809 | 43.2 | 1.8 |
| අනුරාධපුර | 587,929 | 746,466 | 158,537 | 27.0 | 1.2 |
| පොළොන්නරුව | 261,563 | 359,197 | 97,634 | 37.3 | 1.6 |
| බදුල්ල | 640,952 | 774,555 | 133,603 | 20.8 | 0.9 |
| මොනරාගල | 273,570 | 396,173 | 122,603 | 44.8 | 1.8 |
| රත්නපුර | 797,087 | 1,008,164 | 211,077 | 26.5 | 1.2 |
| කෑගල්ල | 684,944 | 779,774 | 94,830 | 13.8 | 0.6 |
| එකතුව | **13,151,065** | **16,864,544** | **3,713,479** | **28.2** | **1.2** |

පහත විස්තර කෙරෙන (යාවකාලික) මූලික ප්‍රතිඵල සාරාංශය ගණන් ගැනීම සම්පූර්ණ වශයෙන් සිදු කළ දිස්ත්‍රික්ක 18 සඳහා අදාළ වේ. කෙසේ වෙතත් අර්ධ වශයෙන් ඇති තොරතුරු ද අදාළ දිස්ත්‍රික් වගුවල දක්වා ඇත. මේ තොරතුරු සකස් කොට ඇත්තේ, සංගණන ගණන් ගන්නා නිලධාරීන් හා අධීක්ෂණ නිලධාරීන් විසින් පිළියෙළ කරනු ලැබූ සංක්ෂේප ලේඛනවලට අනුව වන අතර ඒවා යාවකාලික දත්තයන් ලෙස සැලකිය යුතු වේ.

**2. ජනගහනයේ විශාලත්වය හා වර්ධනය**

දිස්ත්‍රික්ක 18 තුළ අවසාන සංගණන රාත්‍රියේ දී ගණන් ගන්නා ලද මුළු ජනගහනය 16,864,544 කි. මෙය අවසාන වරට 1981 වර්ෂයේ පැවැත් වූ සංගණනයට වඩා සියයට 28 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

දිස්ත්‍රික්ක අනුව, ගණන් ගන්නා ලද ජනගහනය, අන්තර් සංගණන කාලය තුළ වැඩිවීම සහ වර්ධන අනුපාතික A වගුවේ දක් වේ.

1981 - 2001 කාලය තුළ දිස්ත්‍රික්ක 18 සඳහා ජනගහනයේ සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය සියයට 1.2 කි.

දිස්ත්‍රික්ක අනුව වර්ධන අනුපාතිකයේ විශාල වශයෙන් වෙනස්වීම් පෙන්නුම් නොකරයි.

## වගුව B - දිස්ත්‍රික්ක අනුව පුම්තිරි අනුපාතය, 1981-2001

| දිස්ත්‍රික්කය | පුම්තිරි අනුපාතය | |
|---|---|---|
| | 1981 | 2001 |
| කොළඹ | 110.6 | 103.3 |
| ගම්පහ | 101.2 | 94.6 |
| කළුතර | 99.2 | 96.4 |
| මහනුවර | 98.2 | 94.0 |
| මාතලේ | 103.6 | 98.8 |
| නුවරඑළිය | 101.5 | 97.1 |
| ගාල්ල | 95.0 | 93.8 |
| මාතර | 94.2 | 93.3 |
| හම්බන්තොට | 104.5 | 98.9 |
| අම්පාර | 109.9 | 100.4 |
| කුරුණෑගල | 102.3 | 96.5 |
| පුත්තලම | 103.6 | 97.4 |
| අනුරාධපුර | 114.8 | 102.9 |
| පොළොන්නරුව | 131.1 | 108.8 |
| බදුල්ල | 103.2 | 97.9 |
| මොනරාගල | 121.1 | 102.5 |
| රත්නපුර | 107.6 | 101.6 |
| කෑගල්ල | 98.7 | 95.1 |
| එකතුව | **103.9** | **97.9** |

**වගුව C - දිස්ත්‍රික්ක අනුව අවුරුදු 18 ට අඩු සහ අවුරුදු 18 හා ඊට වැඩි ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය, 1981-2001**

| දිස්ත්‍රික්කය | අවුරුදු 18ට අඩු | | අවුරුදු 18 හා ඊට වැඩි | |
|---|---|---|---|---|
| | **1981** | **2001** | **1981** | **2001** |
| කොළඹ | 37.0 | 27.1 | 63.0 | 72.9 |
| ගම්පහ | 38.7 | 28.7 | 61.3 | 71.4 |
| කළුතර | 39.9 | 30.4 | 60.1 | 69.6 |
| මහනුවර | 43.0 | 33.8 | 57.0 | 66.2 |
| මාතලේ | 44.3 | 33.9 | 55.7 | 66.1 |
| නුවරඑළිය | 41.8 | 36.6 | 58.2 | 63.4 |
| ගාල්ල | 41.0 | 33.7 | 59.0 | 66.3 |
| මාතර | 42.4 | 34.5 | 57.6 | 65.5 |
| හම්බන්තොට | 44.6 | 36.3 | 55.4 | 63.7 |
| අම්පාර | 48.8 | 39.8 | 51.3 | 60.2 |
| කුරුණෑගල | 42.1 | 33.7 | 57.9 | 66.3 |
| පුත්තලම | 44.0 | 36.4 | 56.0 | 63.6 |
| අනුරාධපුර | 46.9 | 35.6 | 53.1 | 64.4 |
| පොළොන්නරුව | 43.9 | 34.7 | 56.2 | 65.3 |
| බදුල්ල | 44.9 | 37.0 | 55.1 | 63.1 |
| මොනරාගල | 47.3 | 39.2 | 52.7 | 60.8 |
| රත්නපුර | 42.4 | 34.3 | 57.6 | 65.8 |
| කෑගල්ල | 40.6 | 32.1 | 59.4 | 67.9 |
| එකතුව | **41.6** | **32.9** | **58.4** | **67.1** |

කෑගල්ලෙන් සියයට 0.6 අවමයක් වාර්තාවන අතර අම්පාර දිස්ත්‍රික්කයෙන් සියයට 2.0 උපරිමයක් දක් වේ.

තෙත් කලාපයේ බොහෝ දිස්ත්‍රික්කවල සියයට 1 ට වඩා අඩු ප්‍රතිශත සහිත ඉතා අඩු වර්ධන අනුපාතිකයන් ඇත.

එසේ නමුත් ගම්පහ දිස්ත්‍රික්කයෙන් දෙවැනි වැඩිම වර්ධන අනුපාතිකය වන සියයට 1.9 වාර්තා වේ. විශේෂයෙන් අපනයන සැකසුම් කලාපවලට සිදුවන අභ්‍යන්තර සංක්‍රමණය මීට හේතු විය හැකි ය.

කොළඹ දිස්ත්‍රික්කය ද, සාමාන්‍ය අගයට වඩා වැඩි වර්ධන අනුපාතිකයක් පෙන්වා ඇත. අනිත් අතට, වියලි කලාපීය දිස්ත්‍රික්කවල සියයට 1 ට වඩා වැඩි වර්ධන අනුපාතිකයන් ඇත.

**3. ස්ත්‍රී පුරුෂ සංයුතිය**

ජනගහනයක ස්ත්‍රී පුරුෂ සංයුතිය යනු පුද්ගලයන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වී ඇති අයුරු ය. සංගණනය සම්පූර්ණයෙන් සිදු කළ දිස්ත්‍රික්ක 18 සමස්තයක් ලෙස ගත් කළ මුළු ස්ත්‍රී සංඛ්‍යාව පුරුෂ සංඛ්‍යාවට වඩා 176,616 කින් වැඩි වේ. පුම්තිරි අනුපාතය ස්ත්‍රී පුරුෂ සංයුතියේ ප්‍රයෝජනවත් මිනුමක් වන අතර ඉන් ජනගහනයේ ස්ත්‍රීන් 100ට වඩා වැඩිවන විට පුරුෂ සංඛ්‍යාවේ අභිබවායාමක් හා 100 ට අඩුවන විට ස්ත්‍රී සංඛ්‍යාවේ අභිබවා යාමක් පෙන්නුම් කෙරේ.

වගුව **D** - දිස්ත්‍රික්ක අනුව ජනවර්ගයේ ප්‍රතිශත ව්‍යාප්තිය, **1981-2001**

| දිස්ත්‍රික්කය | සිංහල | | ශ්‍රී ලංකා දෙමළ | | ඉන්දියානු දෙමළ | | ශ්‍රී ලංකා යෝනක | | බර්ගර් | | මැලේ | | ශ්‍රී ලංකා චෙට්ටි | | භාරත | | වෙනත්* | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **1981** | **2001** | **1981** | **2001** | **1981** | **2001** | **1981** | **2001** | **1981** | **2001** | **1981** | **2001** | **1981** | **2001** | **1981** | **2001** | **1981** | **2001** |
| කොළඹ | 77.6 | 76.4 | 10.0 | 11.2 | 1.2 | 1.2 | 8.2 | 9.1 | 1.2 | 0.7 | 1.3 | 0.9 | .. | 0.1 | .. | 0.0 | 0.5 | 0.4 |
| ගම්පහ | 92.0 | 91.1 | 3.5 | 3.1 | 0.4 | 0.4 | 2.7 | 3.9 | 0.6 | 0.5 | 0.6 | 0.6 | .. | 0.3 | .. | 0.0 | 0.2 | 0.1 |
| කළුතර | 87.2 | 87.1 | 1.2 | 1.3 | 4.1 | 2.7 | 7.4 | 8.8 | 0.1 | 0.1 | 0.1 | 0.1 | .. | 0.0 | .. | 0.0 | 0.1 | 0.0 |
| මහනුවර | 74.3 | 74.0 | 5.0 | 4.0 | 9.4 | 8.4 | 10.5 | 13.3 | 0.2 | 0.2 | 0.3 | 0.2 | .. | 0.0 | .. | 0.0 | 0.3 | 0.1 |
| මාතලේ | 80.0 | 80.2 | 5.8 | 5.4 | 7.0 | 5.3 | 7.0 | 8.8 | 0.1 | 0.1 | 0.2 | 0.1 | .. | 0.0 | .. | 0.0 | 0.2 | 0.1 |
| නුවරඑළිය | 42.1 | 40.0 | 12.7 | 5.9 | 42.7 | 51.3 | 2.0 | 2.5 | 0.1 | 0.1 | 0.2 | 0.1 | .. | 0.0 | .. | 0.0 | 0.2 | 0.0 |
| ගාල්ල | 94.5 | 94.3 | 0.9 | 1.2 | 1.4 | 0.9 | 3.2 | 3.6 | 0.1 | 0.0 | 0.0 | 0.0 | .. | 0.0 | .. | 0.0 | 0.1 | 0.0 |
| මාතර | 94.5 | 94.2 | 0.7 | 0.6 | 2.2 | 2.2 | 2.5 | 2.9 | 0.0 | 0.0 | 0.0 | 0.0 | .. | 0.0 | .. | 0.0 | 0.0 | 0.0 |
| හම්බන්තොට | 97.1 | 97.1 | 0.6 | 0.4 | 0.1 | 0.1 | 1.2 | 1.1 | 0.0 | 0.0 | 1.0 | 1.4 | .. | 0.0 | .. | 0.0 | 0.0 | 0.0 |
| අම්පාර | 37.8 | 39.3 | 20.0 | 18.7 | 0.4 | 0.1 | 41.5 | 41.6 | 0.2 | 0.2 | 0.1 | 0.0 | .. | 0.0 | .. | 0.0 | 0.1 | 0.1 |
| කුරුණෑගල | 92.9 | 91.7 | 1.2 | 1.2 | 0.6 | 0.2 | 5.0 | 6.7 | 0.1 | 0.1 | 0.1 | 0.1 | .. | 0.0 | .. | 0.0 | 0.1 | 0.0 |
| පුත්තලම | 82.6 | 73.8 | 6.6 | 6.9 | 0.5 | 0.3 | 9.9 | 18.7 | 0.1 | 0.1 | 0.2 | 0.1 | .. | 0.1 | .. | 0.0 | 0.1 | 0.1 |
| අනුරාධපුර | 91.1 | 90.8 | 1.4 | 0.7 | 0.1 | 0.1 | 7.1 | 8.2 | 0.0 | 0.0 | 0.1 | 0.0 | .. | 0.0 | .. | 0.0 | 0.2 | 0.2 |
| පොළොන්නරුව | 91.4 | 90.3 | 2.0 | 2.0 | 0.1 | 0.0 | 6.4 | 7.6 | 0.0 | 0.0 | 0.1 | 0.0 | .. | 0.0 | .. | 0.0 | 0.2 | 0.0 |
| බදුල්ල | 69.1 | 72.1 | 5.9 | 4.2 | 20.2 | 18.2 | 4.2 | 5.2 | 0.0 | 0.1 | 0.2 | 0.2 | .. | 0.0 | .. | 0.0 | 0.4 | 0.1 |
| මොනරාගල | 92.7 | 94.5 | 2.0 | 1.4 | 3.2 | 1.9 | 1.9 | 2.0 | 0.1 | 0.0 | 0.1 | 0.0 | .. | 0.0 | .. | 0.0 | 0.1 | 0.0 |
| රත්නපුර | 85.0 | 86.6 | 2.4 | 3.4 | 10.6 | 7.8 | 1.7 | 2.1 | 0.1 | 0.0 | 0.1 | 0.0 | .. | 0.0 | .. | 0.0 | 0.2 | 0.0 |
| කෑගල්ල | 85.9 | 85.6 | 2.2 | 1.8 | 6.7 | 5.9 | 5.0 | 6.6 | 0.0 | 0.0 | 0.1 | 0.0 | .. | 0.0 | .. | 0.0 | 0.1 | 0.0 |
| එකතුව | **82.5** | **81.9** | **4.6** | **4.4** | **5.7** | **5.1** | **6.4** | **8.0** | **0.3** | **0.2** | **0.4** | **0.3** | **..** | **0.1** | **..** | **0.0** | **0.2** | **0.1** |

දිස්ත්‍රික් 18 සඳහා පුම්තිරි අනුපාතයන් 1981 සංඛ්‍යාත් සමගින් **B** වගුවේ දැක් වේ.

දිස්ත්‍රික් 18 අතුරින් ඉහළ ම පුම්තිරි අනුපාතය වන 108.8 පොළොන්නරුවෙන් වාර්තා වන අතර තවත් දිස්ත්‍රික්ක පහක අගයන් 100 ට වඩා වැඩි වේ.

එනම් කොළඹ (103.3) අනුරාධපුර (102.9), මොනරාගල (102.5), රත්නපුර (101.6) හා අම්පාර (100.4) වේ. අඩුම පුම්තිරි අනුපාතය මාතර (93.3) දිස්ත්‍රික්කය සඳහා වේ. ගාල්ල (93.8), මහනුවර (94.0), ගම්පහ (94.6), සහ කෑගල්ල (95.1) දිස්ත්‍රික්කවලින් ද අඩු පුම්තිරි අනුපාත පෙන්වයි.

1981 සංගණන සංඛ්‍යාවන් හා සැසැඳීමේ දී දිස්ත්‍රික්ක 18 හි සමස්ත පුම්තිරි අනුපාතය 1981 හි පැවති 103.9 සිට 2001 හි 97.9 දක්වා ඒකක 6.0 කින් පහත වැටී ඇත.

සියලුම දිස්ත්‍රික්කවල අඩුවීමක් වාර්තාවන අතර පොළොන්නරුව හා මොනරාගල පුම්තිරි අනුපාතයන් හි ශීඝ්‍ර පහත බැසම්මක් පෙන්නුම් කරයි. (එනම් පොළොන්නරුව 32.3 ක් හා මොනරාගල 18.6 ක් වශයෙනි.)

**4.වයස්සංයුතිය**

මෙම මූලික අදියරේදී වයස් අනුව බෙදීයාම ලබා ගත හැක්කේ කාණ්ඩ දෙකකට පමණි.

එනම් ජනගහනය අවුරුදු 18 ට අඩු සහ අවුරුදු 18 හා ඊට වැඩි වශයෙනි.

මෙය **C** වගුවෙහි දැක වේ. ජනගහනයෙන් තුනෙන් පංගුවකට ආසන්න සංඛ්‍යාවක් (සියයට 32.9) අවුරුදු 18 ට අඩු ය. මෙම සංඛ්‍යාව ඉතාමත් ම අඩු කොළඹ (සියයට 27.1) වන අතර ඉතා වැඩි අම්පාර (සියයට 39.8) වේ. 1981 දී අවුරුදු 18 ට අඩු ප්‍රතිශතය සියයට 41.6 වන අතර

වගුව E - දිස්ත්‍රික්ක අනුව ආගම්වල ප්‍රතිශත ව්‍යාප්තිය, 1981-2001

| දිස්ත්‍රික්කය | බෞද්ධ | | හින්දු | | ඉස්ලාම් | | රෝමානු කතෝලික | | වෙනත් ක්‍රිස්තියානි | | වෙනත් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1981 | 2001 | 1981 | 2001 | 1981 | 2001 | 1981 | 2001 | 1981 | 2001 | 1981 | 2001 |
| කොළඹ | 70.1 | 70.4 | 7.7 | 8.8 | 9.9 | 10.9 | 9.4 | 7.8 | 2.4 | 2.0 | 0.2 | 0.2 |
| ගම්පහ | 71.1 | 71.6 | 1.9 | 2.1 | 3.5 | 4.6 | 22.5 | 20.4 | 0.9 | 1.4 | 0.1 | 0.1 |
| කළුතර | 84.3 | 83.9 | 4.5 | 3.4 | 7.6 | 8.9 | 3.3 | 3.3 | 0.3 | 0.4 | 0.0 | 0.0 |
| මහනුවර | 73.6 | 73.1 | 12.7 | 10.7 | 11.1 | 13.7 | 1.9 | 1.8 | 0.7 | 0.7 | 0.1 | 0.1 |
| මාතලේ | 78.6 | 79.1 | 11.6 | 9.7 | 7.3 | 9.0 | 2.1 | 1.8 | 0.3 | 0.3 | 0.0 | 0.0 |
| නුවරඑළිය | 41.6 | 39.5 | 50.3 | 51.3 | 2.5 | 2.9 | 4.7 | 4.7 | 0.9 | 1.5 | 0.0 | 0.1 |
| ගාල්ල | 94.2 | 94.1 | 1.9 | 1.6 | 3.2 | 3.6 | 0.4 | 0.4 | 0.2 | 0.3 | 0.1 | 0.0 |
| මාතර | 94.6 | 94.0 | 2.4 | 2.4 | 2.6 | 3.0 | 0.3 | 0.4 | 0.1 | 0.3 | 0.0 | 0.0 |
| හම්බන්තොට | 97.1 | 96.9 | 0.5 | 0.3 | 2.2 | 2.5 | 0.1 | 0.2 | 0.1 | 0.2 | 0.0 | 0.0 |
| අම්පාර | 37.5 | 39.2 | 18.7 | 17.2 | 41.7 | 41.6 | 1.5 | 1.4 | 0.6 | 0.5 | 0.1 | 0.0 |
| කුරුණෑගල | 90.1 | 88.9 | 1.2 | 1.0 | 5.3 | 6.9 | 3.0 | 2.8 | 0.3 | 0.5 | 0.1 | 0.0 |
| පුත්තලම | 48.0 | 43.1 | 3.9 | 4.3 | 10.2 | 19.0 | 37.5 | 32.7 | 0.4 | 1.0 | 0.1 | 0.0 |
| අනුරාධපුර | 90.1 | 90.1 | 1.2 | 0.6 | 7.3 | 8.3 | 1.2 | 0.8 | 0.2 | 0.3 | 0.0 | 0.0 |
| පොළොන්නරුව | 90.1 | 89.3 | 1.8 | 1.9 | 6.5 | 7.7 | 1.3 | 1.0 | 0.1 | 0.2 | 0.0 | 0.1 |
| බදුල්ල | 68.8 | 71.6 | 24.3 | 20.7 | 4.6 | 5.5 | 1.8 | 1.6 | 0.5 | 0.6 | 0.0 | 0.0 |
| මොනරාගල | 92.7 | 94.4 | 4.7 | 3.0 | 2.0 | 2.1 | 0.4 | 0.4 | 0.1 | 0.2 | 0.0 | 0.0 |
| රත්නපුර | 84.8 | 86.4 | 11.6 | 9.9 | 2.0 | 2.2 | 1.4 | 1.1 | 0.3 | 0.5 | 0.0 | 0.0 |
| කෑගල්ල | 85.2 | 84.7 | 7.9 | 6.8 | 5.2 | 6.8 | 1.2 | 1.1 | 0.5 | 0.6 | 0.0 | 0.0 |
| **එකතුව** | **77.3** | **76.7** | **8.6** | **7.9** | **6.9** | **8.5** | **6.4** | **6.1** | **0.7** | **0.8** | **0.1** | **0.1** |

1981-2001 කාලය තුළ දී එය ප්‍රතිශත ඒකක 8.7 කින් පහත බැස ඇත.

මේ නිසා ජනගහනයේ වයස් පිරමීඩය පහළ වයස්වල දී පටු-වීමක් පෙන්නුම් කරන අතර සඵලතාවයේ අඩුවීම එයට ප්‍රධාන වශයෙන් බලපායි. සියලු ම දිස්ත්‍රික්කවල වයස අවුරුදු 18 ට අඩු ප්‍රතිශතයන් හි අඩුවීමක් වාර්තා වේ.

මෙම පහත වැටීම අනුරාධපුරයේ ඉතා වැඩිවන අතර ඊළඟට ඇත්තේ මාතලේ හා ගම්පහ දිස්ත්‍රික්කවල ය.

**5. ජන වර්ගය අනුව සංයුතිය**

ජන වර්ගය අනුව ජනගහනයේ බෙදී යාම D වගුවේ දැක්වේ. දිස්ත්‍රික්ක 18 හි සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ සහ ශ්‍රී ලංකා යෝනක ජනගහනයේ ප්‍රතිශත පිළිවෙලින් 81.9, 4.4, 5.1 සහ 8.0 වේ. සිංහල ජනගහනයේ ඉහළ ම ප්‍රතිශතය (සියයට 97.1) හම්බන්තොටින් වාර්තාවන අතර පහළ ම ප්‍රතිශතය (සියයට 39.3) අම්පාරෙන් වාර්තා වේ. ශ්‍රී ලංකා දෙමළ ජනගහනයේ ඉහළ ම ප්‍රතිශතය (සියයට 18.7) අම්පාරෙන් වාර්තා වන අතර ඊළඟට වැඩි ම දිස්ත්‍රික්කය කොළඹ (සියයට 11.2) වේ.

ශ්‍රී ලංකා යෝනක ජනගහනය වැඩි වශයෙන් සිටිනුයේ අම්පාර හා පුත්තලම දිස්ත්‍රික්කවල ය. (පිළිවෙලින් සියයට 41.6 සහ සියයට 18.7) මහනුවර දිස්ත්‍රික්කයේ ද එය තරමක් විශාල අනුපාතයක් (සියයට 13.3) වේ.

අනෙක් අතින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් අඩකට වඩා ඉන්දියානු දෙමළ (සියයට 51.3) වන අතර බදුල්ල දිස්ත්‍රික්කයේ එම ප්‍රතිශතය ජනගහනයෙන් සියයට 18.2 ක් වේ.

1981 සංගණනයේ අනුරූප සංඛ්‍යා සමග සැසඳීමේ දී දිස්ත්‍රික්ක 18 සඳහා ශ්‍රී ලංකා

## වගුව F - අංශය හා දිස්ත්‍රික්ක අනුව ජනගහනයේ ව්‍යාප්තිය, 2001

| දිස්ත්‍රික්කය | මුළු ජනගහනය | | නාගරික | | ග්‍රාමීය | | වතු | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 2,234,146 | 100.0 | 1,221,761 | 54.7 | 1,005,071 | 45.0 | 7,314 | 0.3 |
| ගම්පහ | 2,066,096 | 100.0 | 301,689 | 14.6 | 1,763,838 | 85.4 | 569 | 0.0 |
| කළුතර | 1,060,800 | 100.0 | 112,715 | 10.6 | 913,199 | 86.1 | 34,886 | 3.3 |
| මහනුවර | 1,272,463 | 100.0 | 156,923 | 12.3 | 1,023,092 | 80.4 | 92,448 | 7.3 |
| මාතලේ | 442,427 | 100.0 | 36,352 | 8.2 | 384,209 | 86.8 | 21,866 | 4.9 |
| නුවරඑළිය | 700,083 | 100.0 | 43,050 | 6.1 | 283,870 | 40.5 | 373,163 | 53.3 |
| ගාල්ල | 990,539 | 100.0 | 110,654 | 11.2 | 862,880 | 87.1 | 17,005 | 1.7 |
| මාතර | 761,236 | 100.0 | 64,539 | 8.5 | 676,533 | 88.9 | 20,164 | 2.6 |
| හම්බන්තොට | 525,370 | 100.0 | 21,671 | 4.1 | 502,268 | 95.6 | 1,431 | 0.3 |
| අම්පාර | 589,344 | 100.0 | 112,422 | 19.1 | 476,922 | 80.9 | - | - |
| කුරුණෑගල | 1,452,369 | 100.0 | 34,719 | 2.4 | 1,410,904 | 97.1 | 6,746 | 0.5 |
| පුත්තලම | 705,342 | 100.0 | 65,072 | 9.2 | 638,728 | 90.6 | 1,542 | 0.2 |
| අනුරාධපුර | 746,466 | 100.0 | 56,632 | 7.6 | 689,834 | 92.4 | - | - |
| පොළොන්නරුව | 359,197 | 100.0 | - | - | 359,197 | 100.0 | - | - |
| බදුල්ල | 774,555 | 100.0 | 52,474 | 6.8 | 565,242 | 73.0 | 156,839 | 20.2 |
| මොනරාගල | 396,173 | 100.0 | - | - | 387,949 | 97.9 | 8,224 | 2.1 |
| රත්නපුර | 1,008,164 | 100.0 | 58,371 | 5.8 | 847,896 | 84.1 | 101,897 | 10.1 |
| කෑගල්ල | 779,774 | 100.0 | 17,430 | 2.2 | 706,726 | 90.6 | 55,618 | 7.1 |
| එකතුව | **16,864,544** | **100.0** | **2,466,474** | **14.6** | **13,498,358** | **80.0** | **899,712** | **5.3** |

යෝනක හැර සියලු ජන වර්ග සඳහා සමස්ත ප්‍රතිශතයන් හි සුළු අඩුවීමක් සිදුව ඇත. ශ්‍රී ලංකා යෝනක ජනගහනයේ ප්‍රතිශතය 1981 සිට 2001 දක්වා ඒකක 1.6 ක වැඩිවීමක් පෙන්වයි.

බදුල්ල (ප්‍රතිශත ඒකක 3.0 ක) මොනරාගල ((ප්‍රතිශත ඒකක 1.8 ක) රත්නපුර (ප්‍රතිශත ඒකක 1.6 ක) අම්පාර (ප්‍රතිශත ඒකක 1.5 ක) සහ මාතලේ ((ප්‍රතිශත ඒකක 0.2 ක) දිස්ත්‍රික්කවල සිංහල ජනගහනය ප්‍රතිශතමය වශයෙන් වර්ධනයක් සිදුව ඇති අතර අනෙකුත් දිස්ත්‍රික්කවල ප්‍රතිශතය යම් ප්‍රමාණයකින් අඩුවීමක් සිදුව ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ සිංහල ජනගහනයේ ප්‍රතිශතය ඒකක 8.8 කින් පහත බැස ඇති අතර එවැනි ම ප්‍රමාණයකින් පුත්තලමේ ශ්‍රී ලංකා යෝනක ජනගහනය වැඩි වී ඇත.

ශ්‍රී ලංකා දෙමළ ජනගහනයේ ප්‍රතිශතය කොළඹ (ප්‍රතිශත ඒකක 1.2) රත්නපුර (ප්‍රතිශත ඒකක 1.9) පුත්තලම (ප්‍රතිශත ඒකක 0.3) ගාල්ල (ප්‍රතිශත ඒකක 0.3) සහ කළුතර (ප්‍රතිශත ඒකක 0.1) යන දිස්ත්‍රික්කවල වැඩි වී ඇති අතර අනෙකුත් සියලු දිස්ත්‍රික්කවල යම් ප්‍රමාණයක අඩුවීමක් පෙන්වයි. මෙම අඩුවීම නුවරඑළිය දිස්ත්‍රික්කයේ (ප්‍රතිශත ඒකක 6.8) ඉතා ඉහළ මට්ටමක් පෙන්වන නමුත් එහි ඉන්දියානු දෙමළ ජනගහනය ප්‍රතිශත ඒකක 8.6 කින් වර්ධනය වී ඇත.

1981 සංගණනයේ දී සමහර ඉන්දියානු දෙමළ පුද්ගලයින් ශ්‍රී ලංකා දෙමළ වැරදියට සටහන් වී තිබුණ බව වාර්තා වී ඇත. ජන වර්ග දෙකෙහි ප්‍රතිශත වෙනස්කම් ප්‍රතිවිරුද්ධ දිශාවට වෙනස් වී තිබීමෙන් එලෙස වැරැදි වාර්තා ගතවීම් 2001 සංගණනයේ දී යම් ප්‍රමාණයකට නිවැරැදි වී තිබිය හැකි බැව් පෙනී යයි.



1981 - 2001 කාලය තුළ ජාතීන් අනුව ජනගහන ව්‍යාප්තියේ වෙනස්කම්වල කැපී පෙනෙන ලක්ෂණයක් නම් ශ්‍රී ලංකා යෝනක ජනගහනයේ ප්‍රතිශතය දිස්ත්‍රික් 18 අතුරින් 17 ක ම වැඩි වී තිබීමයි. මෙම තත්ත්වය වෙනස් වන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පමණි. මෙම වැඩිවීම ඉතාම වැඩි වන්නේ පුත්තලම (ප්‍රතිශත ඒකක 8.8) දිස්ත්‍රික්කයේ ය.

### 6. ආගම අනුව සංයුතිය

ආගම අනුව ජනගහනය බෙදීයාම E වගුවෙන් දැක් වේ. දිස්ත්‍රික් 18 මුළු ජනගහනය අතරින් සියයට 76.7 ක් බෞද්ධ, සියයට 7.9 ක් හින්දු, සියයට 8.5 ක් ඉස්ලාම්, සියයට 6.1 රෝමානු කතෝලික සහ සියයට 0.8 ක් අනෙකුත් ක්‍රිස්තියානි ලෙස ද ආගම් අනුව බෙදී යයි.

බෞද්ධයින්ගේ ඉහළ ම ප්‍රතිශතය හම්බන්තොටින් (සියයට 96.9) වාර්තා වන අතර අවම ප්‍රතිශතය අම්පාරෙන් (සියයට 39.2) වාර්තා වේ. හින්දු භක්තිකයන්ගේ ඉහළ ම ප්‍රතිශතය නුවරඑළියෙන් (සියයට 51.3) ද ඊළඟට බදුල්ලෙන් (සියයට 20.7) ද වේ.

මෙම ප්‍රදේශවල දෙමළ ජනගහනය වැඩි නිසා මෙම තත්ත්වය අපේක්ෂා කළ හැක. එසේම යෝනක ජනතාව විශාල කොටසක් සිටින අම්පාර දිස්ත්‍රික්කයේ වැඩි ම ඉස්ලාම් භක්තිකයන් සංඛ්‍යාවක් (සියයට 41.6) ඇත.

දිස්ත්‍රික්ක 18 හි ඉස්ලාම් හා අනෙකුත් ක්‍රිස්තියානි හැර සියලු ආගමික කණ්ඩායම්වල සමස්ත ප්‍රතිශතයන් සුළු වශයෙන් අඩු වී ඇති බව 1981 සංගණනයේ අනුරූප අගයන් හා සැසඳීමේ දී පැහැදිලි වේ. ඉස්ලාම් භක්තිකයන් ප්‍රතිශත ඒකක 1.6 කින් වැඩි වී ඇති අතර අනෙකුත් ක්‍රිස්තියානි භක්තිකයන් ප්‍රතිශත ඒකක 0.1 කින් සුළු වශයෙන් වැඩි වී ඇත.

### 7. අංශ අනුව සංයුතිය

2001 සංගණනයේ දී, නාගරික අංශය සියලු මහනගර සභා සහ නගර සභා ප්‍රදේශවලින් සමන්විත වේ. අක්කර 20 ක් හා ඊට වැඩි හා නේවාසික කම්කරුවන් 10 ක් හෝ ඊට වැඩි, වගාවක් සහිත ඉඩකඩම් වත්තක් ලෙස අර්ථ දැක් වේ.

අනෙකුත් ප්‍රදේශ සියල්ල ග්‍රාමීය අංශය වශයෙන් සලකනු ලැබේ. වතු අංශය 1981 සංගණනය සඳහා යොදා ගත් අර්ථ දැක්වීමට සමාන වන නමුත් නාගරික අංශය සඳහා වන අර්ථ දැක්වීම මෙම සංගණන දෙක අතර නොසැසඳේ. 1981 සංගණනයේ දී නාගරික ලෙස සැලකූ සුළු නගර සභා අහෝසි කිරීමත් 1987 සිට එවැනි ප්‍රදේශවල පරිපාලන ග්‍රාමීය වශයෙන් සැලකෙන ප්‍රාදේශීය සභා යටතට පත්කිරීමෙන් ප්‍රතිඵලයක් ලෙස මෙසේ සිදු වී ඇත. එමනිසා නාගරික ජනගහන සංඛ්‍යා හා ප්‍රතිශත අර්ථ නිරූපනය කිරීම ප්‍රවේශමෙන් සිදු කළ යුතු වේ.

ජනගහනය අංශ අනුව වෙන් කිරීම F වගුවේ දැක්වේ. දිස්ත්‍රික්ක 18 සඳහා නාගරික, ග්‍රාමීය හා වතු ප්‍රතිශතයන් පිළිවෙලින් 14,6,80.0 සහ 5.3 වේ. වැඩිම නාගරික ජනගහනය කොළඹ දිස්ත්‍රික්කයේ (සියයට 54.7) වන අතර ඊළඟට වැඩි අම්පාර (සියයට 19.1) සහ ගම්පහ (සියයට 14.6) වේ. අපේක්ෂිත පරිදි වතු ජනගහනයේ වැඩිම ප්‍රතිශතයක් (සියයට 53.3) ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ය.

වතු ජනගහනය බදුල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතින අතර පිළිවෙලින් එය සියයට 20.2 හා සියයට 10.1 වේ. ❑

**(මෙම සංගණන තොරතුරු ලබා දීමෙන් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංගණන නියෝජ්‍ය අධ්‍යක්ෂ එච්.ආර්. ගුණසේකර මහතා ලබා දුන් අනුග්‍රහය පිළිබඳ තුතිය පළ කරමු.)**